## අප විසින් මූලධර්මවාදීන් සමග කථා කරද්දී අප දැනුවත් විය යුතු කරුණු

1) දෙවිවරු වර්ග කීයක් ඉන්නවද?
God - මවපු නැති දෙවිවරු --> අම්මල තාත්තල නෑ
god - මවපු දෙවිවරු --> අම්මල තාත්තල ඉන්නවා

2- God ඉන්න ආගම් මොනවද? - ජුදා, ඉස්ලාම්, ක්‍රිස්තියානි

3- God ට හැකියි අපට සහතිකයක් දෙන්න එතුමා කියන විධියට (දහමට අනුව) අපි ජිවත් වුවහොත්, අපේ ජිවිතය සන්තෝෂයෙන් ගෙවන්න ඒ අය සහතික වෙනවා කියලා.
මේක හරියට අපි අපේ කාර් එක පාරට දාද්දි රක්ෂණ ආවරණයක් ගන්නවා වගෙයි, අපේ කාරයට මගදි අනතුරක් වුනොත් රක්ෂණ සමාගමෙන් ඒක හදාදෙනවා.

4- god ලට එහෙම සහතිකයක් දෙන්න බෑ. ඒ ගොල්ල ලගට අපේ අර්බුදයක් අරන් ගියාම විසඳුමක් සඳහා මේ දේ කරන්න කියල කියන්න තමාගෙම දහමක් ඒ අය ලග නෑ. God ල ගෙන් ඉල්ලාගෙන තමයි දෙන්න වෙන්නෙ. (හරියට අපේ සාන්තුවරයෝ වගේ)

5- අපේ ජිවිතය අනිත්‍යද? ඔව්, අපි වැඩක් කරනවා යම්කිසි ප්‍රතිඵලයක් බලාපොරොත්තුව හැබැයි අපි හිතන ප්‍රතිඵලය ඒ විධියටම ලැබෙන්නේ නෑ. එවිට අපේ සතුට නැතිව යනවද?
උදාහරණයක් ලෙස මෙහෙම හිතමු.
අපි අපේ කාර් එක පාරට දානවා ගමනක් යන්න. මගදි අනතුරක් නොවෙයි කියල තමයි බලාපොරොත්තුව. මගදි අනතුරක් වුනොත් ප්‍රශ්ණ ගොඩයි. නමුත් රක්ෂණ ආවරණයක් තියේනම් රක්ෂණ වාරික නිසි ලෙස ගෙවා ඇත්නම් රක්ෂණ සමාගමෙන් ඒ ගැන බලාගන්නවා හිතට සැහැල්ලුයි. අපේ මේ අනිත්‍ය ජිවිතය සන්තෝෂයෙන් ගෙවන්න නම් අපිත් God තුල රක්ෂණය විය යුතුයි. නැත්නම් කලකිරීම තමා ජිවිත අත්දැකීම වෙන්නේ.

6- ක්‍රිස්තියානි God මිනිස් භාවය ගෙන මෙලොවට එන්න නම් කිසිම පාප කිලුටක් නැති ස්ත්‍රියක ගෙන් තමා උපදින්න ඕන. ඒ නිසා තමයි ජන්ම පාප දෝෂයෙනුත් නිර්දෝශී කන්‍යාවක වූ මරිය තුමිය ගෙන් ජේසුතුමා උපදින්නේ. ජේසුතුමා අප සමග ජිවත්වී මේ අනිත්‍ය ජිවිතයේ එන මානසික හා ශාරිරික ප්‍රශ්න ප්‍රායෝගිකව කෙසේද විසඳා ගන්නේ කියලා අපට පෙන්වා දුන්නා. දෙව් අනට කීකරුව ජිවත්විම තුලින් දේව සංරක්ෂණය ලබා ගැනීම පමනක් නොව, එතුමා ස්ථාපිත කල සභාව හරහා සක්‍රමේන්තු(7) තුළින් දේව වරප්‍රසාද බහුලව ලබා ගැනීමේ මගත් අපට ලබා දුන්නා.

7- Preaching සහ Teaching(ඉගැන්වීම) අතර තිබෙන වෙනස මොකක්ද? Teaching for MIND and Preaching for HEART? ජේසුතුමාගේ මෙලොව කාර්‍යය වුනේ Teaching Preaching and Healing. අනිත් Godලත් Preaching and Healing පෙන්නල තියෙනවද?

8- ඇයි ජේසුතුමා සෑමවිටම වාගේ Healing කලාට පසු තමන්ගේ ජිවිත ක්‍රමය, ජිවිත ආකල්පය (Attitude) වෙනස් කර ගන්න කිව්වේ? "නැවත පව් නොකරන්න" මොකක්ද අද අපිට මෙසේ කීමේ අරුත කියා දෙන පාඩම?

9- අපේ දෙවිතුමා God අපිට කියා දුන්නා පමනක් නොව අප සමග ජිවත්වී පෙන්වා දී තියෙනවා කොහොමද අපි එතුමා කියන සන්තෝෂය අත්දකින්නේ කියලා. දසපනතට අමතරව සක්‍රමේන්තු 7 ක්, දයාවේ දීමනා 14 ක් දානය කරමින්, ඉතා අසීරු අවස්ථාවක වූවත් අන් අයට සමාව දෙන්නේ කොහොමද කියලාත් පෙන්වා දී තියෙනවා. අපගේ ශරීරය ආරක්ෂා කරගනිමින්, එය ප්‍රශස්ථ ලෙස පවත්වා ගන්නටත්, අපේ හැකියාවන් දියුණු කරගන්නා අයුරුත් කියා දුන්නා.

10- ඔබ හමුවට එන මේ සහෝදරයන් සමග ආරවුල් ඇති කර ගන්න එපා. කතා කරල බලන්න. ඒ අයට ඉන්නෙ God කෙනෙක්ද නැතිනම් god කෙනෙක්ද කියලා? ඒ දෙවිතුමා ලෝකයට ඇවිත් අප සමග ජිවත්වී අපට මාර්ගයක් පෙන්වා දුන්නාද කියලා අහල බලන්න? ඔබ කතෝලික සභාවෙන් ඉවත් වී ඔවුන්ගේ සභාවට එක් විය යුත්තේ ඇයි කියා හේතු කිහිපයක් කරුණාකර ලියා දෙන්න කියන්න. එහෙම ලියල දුන්නොත් ඒ කරුණු ඔබේ මීසමේ පියතුමාට ඔබම දෙන්න.